පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය **08**

# අවසාන වාර පරීක්ෂණය - 2022

විෂයය :- නාට්‍ය හා රංගකලාව

පාසලේ නම : ..............................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය : පැය 02 යි.

## I කොටස

- පළමු කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න
- පහත දැක්වෙන කවි, ගී පද ඇසුරින් 1 - 4 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A. මව්පියො නිදහස් වෙන්නටා
මාව දුන්නයි නාකි වූ හමෙකුටා

B. ඉඳින් බබෝ ඉඳින් - මගේ අතේ ඉඳින්
බොහෝ ආදරෙන් නුඹේ මව් මෙන් - රකින්නෙමි මෙමං

C. බයෙන් තැවුල් අය ලඟ නොනිදන්නේ
දිරූ ගෙවල් ගල් ලඟ නොසිටින්නේ

D. කුදා වැනෙන්නේ සබයේ කොක් හඬලන්නේ
විදා පාන්නේ අත්දෙක තැගි කියන්නේ

01. නාඩගම් සම්ප්‍රදායට අයත් ගීත ඛණ්ඩයක් ඇතුලත් අක්ෂරය වන්නේ,

1. A 2. B 3. C 4. D

02. ඉහත ' A' අක්ෂරයෙන් දැක්වෙන කවිය අයත් වන්නේ,

1. නාඩගම් වලට
3. කෝලම් වලට
2. සෙකරි වලට
4. නූර්ති වලට

03. මෙහි දැක්වෙන සිරිත් මල්දමේ එන කවි දෙපදයක් වනුයේ,

1. A 2. B 3. C 4. D

04. මෙහි D අක්ෂරයෙන් දැක්වෙන පදා අයත් ජන නාටකය වන්නේ,

1. කෝලම් 2. සොකරි 3. නාඩගම් 4. නූර්ති

- පහත දැක්වෙන ප්‍රශ්න වලට අදාල නිවැරදි පිළිතුරු තෝරන්න.

05. නිර්මාණයක දී පරිකල්පනය ලෙස හඳුන්වන්නේ,

1. නිෂ්පාදකවරයා මත සිදුවන දෙයකි.
2. තනි පුද්ගලයෙක් මත සිදුවන දෙයකි.
3. පරිකල්පනය අවශ්‍ය නොවන දෙයකි.
4. පුද්ගලයින් කීප දෙනෙකු මත සිදුවන දෙයකි.

06. නළුවරණයේ දී සැලකිය යුතු කරුණක් වන්නේ.

1. අධ්‍යක්ෂකවරයා ඥාතියෙකු වීම.
2. දක්ෂතාවය හා කැපකිරීමයි.
3. ලස්සන රූපයක් තිබීමයි.
4. මුදල් වියදම් කල හැකි වීමයි.

07. නාට්‍යක සංගීතය හා නාට්‍ය ගීත අයත් වන්නේ පිළිවෙලින් කුමන අභිනයට ද ?

1. ආහාර්ය අභිනයට හා වාචික අභිනයට.
2. වාචික අභිනයට හා ආහාර්ය අභිනයට.
3. ආංගික අභිනයට හා වාචික අභිනයට.
4. ආහාර්ය අභිනයට හා ආංගික අභිනයට.

08. නාට්‍යෝචිත ලක්ෂණයක් නොවන්නේ,

1. නැටුම් සහිත වීමයි. 2. සංගීතය සහිත වීමයි.
3. ප්‍රේක්ෂක සහභාගීත්වයයි. 4. අනුකරණ ලක්ෂණ තිබීමයි.

09. අභිරූපණයේ දී භාවිත නොකරන අභිනය නම්,

1. ආංගික අභිනයයි. 2. සාත්වික අභිනයයි.
3. වාචික අභිනයයි. 4. අහාර්ය අභිනයයි.

10. නාට්‍ය පෙළකින් කියවෙන ප්‍රධාන අදහස හඳුන්වනු ලබන්නේ,

1. ගැටුම 2.තේමාව 3. පණිවුඩය 4.කතා සාරාංශය

- 11 සිට 15 දක්වා ප්‍රශ්න වලට හරි නම් (√) ලකුණ ද, වැරදි නම් (X) ලකුණ ද, යොදන්න.

11. කතාවේ මූලික හරයට හානි නොවන පරිදි කතා වස්තුව ගොඩ නැගිය යුතුය. (     )
12. වාචික අභිනය සඳහා ගීත සංවාද අත්‍යාවශ්‍ය නොවේ. (     )
13. රූපණයේ දී ප්‍රේක්ෂක අවධානය ලබා ගැනීමට සාර්ථක රංගනයක් අවශ්‍ය වේ. (     )
14. නාට්‍යක පුහුණු වීම සංවිධානය කරන්නේ රචකයා යි. (     )
15. වේෂ භූෂණ නිර්මාණයේ දී වටිනාකමින් වැඩි රෙදි භාවිතා කල යුතුය. (     )

- නිවැරදි පිළිතුර තෝරන්න.

16. ආංගික අභිනයට අයත් නොවන්නේ,

| | | | |
|---|---|---|---|
| 1. | අංග. | 2. | විකලාංග. |
| 3. | ප්‍රත්‍යාංග. | 4. | උපාංග. |

17. භවාත්මක හැඟීම් ප්‍රකාශය යනු,

| | | | |
|---|---|---|---|
| 1. | වාචික අභිනය. | 2. | ආහාර්ය අභිනය. |
| 3. | සාත්වික අභිනය. | 4. | ආංගික අභිනය. |

18. රංග අභ්‍යාස වැදගත් වන්නේ,

| | | | |
|---|---|---|---|
| 1. | නිෂ්පාදක වරයාටය. | 2. | අධ්‍යක්ෂක වරයාටය. |
| 3. | වේදිකා පරිපාලක වරයාටය. | 4. | නළු නිළියන්ටය. |

19. ශාන්ති කර්ම ගී ගායනයේ දී ,

    1. බෙරහඬ පරයා ශබ්ද නගා ගායනා කරනු ලබයි.
    2. සම්ප්‍රදායන්ට ආවේනික තාලයකට ගායනා කරයි.
    3. රහපාමින් ගායනය කරයි.
    4. ඉහත සියල්ලම සිදු කරයි.

20. වේෂ භූෂණ නිර්මාණයේ දී සැලකිලිමත් නොවිය යුත්තේ,

    1. වර්ණ භාවිතය පිළිබඳවයි.
    2. කාලය, යුගය , දේශයට ගැලපීම පිළිබඳවයි.
    3. රංගනයට අපහසු නොවන ලෙස නිර්මාණය කිරීම පිළිබඳවයි.
    4. රූපණ ශිල්පියාට අවශ්‍ය වන ලෙස නිර්මාණය කිරීම පිළිබඳවයි. ( ල. 2 x 20 = 40 )

## II කොටස

- උපදෙස් :- දෙවන කොටසේ ප්‍රශ්න හතෙන් පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය ය. තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න. පිළිතුරු ලිවිය යුතු මුලු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

01. වළහා සහ මාෂා නාට්‍ය ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

    i. වළහා සහ මාෂා නාට්‍ය කුමන නාට්‍ය වර්ගයට අයත් වේද. ( ල - 2 )
    ii. මෙම නාට්‍යයේ මාෂා කැළයේ අතරමං වූයේ කෙසේද ? ( ල - 2 )
    iii. මාෂා සැඟවී යාමට භාවිතා කළ උපක්‍රමය කුමක් ද ? ( ල - 2 )
    iv. මාෂාගේ චරිත ලක්ෂණ දෙකක් ලියන්න. ( ල - 2 )
    v. මාෂා වළහාගේ නිවසට ඇතුළුවන විට දැකිය හැකි පසුතල 02 ක්, හා රංග භාණ්ඩ 02ක් ලියන්න. ( ල - 2 )
    vi. මෙම නාට්‍යයෙන් ජීවිතයට ගත හැකි ආදර්ශ 03ක් ලියන්න. ( ල - 2 )

02.

    i. නාට්‍ය ගීත නාට්‍ය සඳහා යොදාගන්නේ ඇයි? ( ල - 2 )
    ii. නාට්‍ය ගීත ගායනයේ දී සැලකිලිමත් විය යුතු ලක්ෂණ 04ක් ලියන්න. ( ල - 4 )
    iii. ඔබ දන්නා නාට්‍ය ගීතයක් ලියා දක්වන්න. ( ල - 6 )

03.

i. ඔබ දන්නා රංග අභ්‍යාස 04ක් ලියන්න. ( ල - 2 )

ii. රංග අභ්‍යාස මගින් රූපණ ශිල්පියෙකුට ලැබෙන ප්‍රයෝජන 04 ක් ලියන්න. ( ල - 4 )

iii. ඔබ දන්නා දන්නා රංග අභ්‍යාසයක් පංති කාමරයේ සිදු කල ආකාරය පිළිවෙලින් ලියන්න. ( ල - 6 )

04.

i. ආනුෂංගික අංග 04 ක් නම් කරන්න. (ල - 2)

ii. ආනුෂංගික අංග යනු මොනවාද ? (ල - 4)

iii. ඉහත සඳහන් කල එක් අංගයක් සඳහා දායක වන ශිල්පියෙකුගේ කාර්යභාරය විස්තර කරන්න. (ල - 6)

05.

i. නාට්‍ය පෙළක් සාර්ථක කර ගැනීමට බලපාන හේතු දෙකක් දක්වන්න. (ල - 2 )

ii. නළුවරණය යනු කුමක් ද ? (ල - 4 )

iii. නාට්‍යයක් සඳහා නළුවන් තෝරා ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු 04 ක් ලියන්න. ( ල - 6 )

06.

i. රූපණයේ දී චරිතයේ සාර්ථකත්වයට වේශභූෂණ බලපාන්නේ කෙසේ ද ? ( ල - 2 )

ii. වේෂ භූෂණ නිර්මාණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු 04 ක් ලියන්න. ( ල - 4 )

iii. වලහා සහ මාෂා නාට්‍යයේ චරිත සඳහා සුදුසු ඇඳුම් නිර්මාණ ඇඳ දක්වන්න. ( ල - 6 )

07. පහත අවස්ථාව පාදක කරගෙන කෙටි නාට්‍යකට සුදුසු පෙළ රචනයක් ලියන්න. ඔබ කැමති ආකාරයට චරිත සංඛ්‍යාව වෙනස් කරගත හැක.

**“ එක් කලෙක බුද්ධිමත් නායක වඳුරෙකු සහ ඔහුගේ වඳුරු රංචුවක් වනයේ ජීවත් විය.දිනක් මෙම වඳුරු රංචුව කෑම සොයා වනයේ ගමන් කරමින් යන විට දැඩි පිපාසයක් ඇතිවෙයි.මෙම රංචුව වනය මැද වතුර පිරි විලක් දැක, එක් වඳුරු පැටවෙකු විලට බැසීමට දිව යයි.................... එක් වරම ,, .......**

i. රංග විධාන සහිත සංවාද ගොඩ නගා තිබීම. ( ල - 4 )

ii. චරිත අතර ගැටුමක් ඇතිවන අයුරින් පෙල සකස් කිරීම. ( ල - 4 )

iv. දෙගිඩියාව, කුතුහලය, උත්ප්‍රාසය සහිතව නාටෝචිත අවස්ථා නිර්මාණය කර තිබීම. ( ල - 4 )



LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
ඉතිහාසය
2013 - 2022
සංගීතය
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න